ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, සෙත්සිරි කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. | 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல | 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/PTR/9-7/FI/6(D)

ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }

දිනය / திகதி / Date } 2026.07.03

ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය.

ප්‍රධාන ලේකම්,
වයඹ/ උතුරු මැද/ උතුර/ නැගෙනහිර/ සබරගමුව/ ඌව/ මධ්‍යම/ දකුණු පළාත

ලේකම්,
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ III/II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ III/II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් නොලැබුණ හොත් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද, එසේත් නොමැති නම් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යාවේ III/II ශ්‍රේණියේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සළකා බලනු ලැබේ.

අනු අංකය	තනතුර	අනුමත ශ්‍රේණිය	පුරප්පාඩුව පවතින ආයතනය
1	සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන)	III/II	බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

03. **තනතුර සඳහා සුදුසුකම් -**

I. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ/ විශේෂ සේවක සංඛ්‍යාවේ III ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම/ II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

II. අයදුම්කරු, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන **2026.07.24** දිනට පූර්වාසන්න වසර 05 තුල දී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර, එම වසර 05 තුලදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

III. සෑම අයදුම්කරුවෙකුම තම තනතුරේ සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

04. <u>තෝරාගනු ලබන ක්‍රමවේදය</u> -

ඉහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම්ව ලකුණු ලබා දී, එම ලකුණු මත පදනම්ව ඉහළම ලකුණු ලබා ගත් නිලධාරියා අදාළ තනතුරට තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ. (ආදර්ශ අයදුම්පත්‍රය හා ලකුණු ලබාදීමේ ක්‍රමඉඟිය මේ සමඟ අමුණා ඇත.)

05. නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කල යුතු වේ.

06. ඒ අනුව, මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කලාප අධ්‍යාපන කාර්යාලයේ හා ඒ යටතේ වන ආයතනයන්හී සේවය කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් දැනුවත් කර, මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් නිසි ධුරාවලිය මඟින් **<u>2026.07.24 දින හෝ ඊට පෙර</u>** " ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බස්නාහිර පළාත් සභාව), අංක. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට කටයුතු කරන ලෙස දැනුවත් කරන්නේ නම් මැනවි.

07. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. <u>අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර අදාල අයදුම්පත් ප්‍රධාන ලේකම් (බ.ප) වෙත ලැබිය යුතු අතර, එදිනට පසුව ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද අයදුම්පත් යොමු කරන ධුරාවලියේ රැඳී තිබී මෙම කාර්යාලය වෙත ලැබීමට ප්‍රමාද වූ බවට කරන පැමිණිලි පිළිබඳව සලකා බලනු නොලැබේ.</u> මෙම පත් කිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සතුවේ.

08. එසේම, යම් නිලධාරියෙකු උක්ත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් එම නිලධාරියා අදාළ පරිපාලන බලධාරියා වෙතින් බස්නාහිර පළාත් සභාව වෙත නිදහස් කරවා ගැනීමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ට මැදිහත් විය නොහැකි බවද සැලකුව මැනවි.

09. <u>තවද ඉහත තනතුර සඳහා **2025.05.26** හා **2025.10.07** දිනැති අයදුම්පත් කැඳවීමේදී අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන් මෙම නිවේදනය පරිදි නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.</u>

කේ.ජී. ප්‍රදීප පුෂ්ප කුමාර
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

දුරකථන අංකය : 011- 2092599
ෆැක්ස් අංකය : 011- 2092601
විද්‍යුත් ලිපිනය : chiefsecwp@gmail.com